# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,465 - 2025 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2025.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 19 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 05 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82740 - (2025/11)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තනතුර සඳහා බඳවා ගැනීම - 2025**

නීතිපති දෙපාර්තමේන්තුවේ, රජයේ අධිනීතිඥ තනතුරුවල පවතින පුරප්පාඩු **32** ක් දක්වා සුදුස්සන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන අංශයෙන් අයදුම්පත්‍ර ලබාගත හැකි අතර, අයදුම්පත්‍ර පහත සඳහන් දිනට හෝ ඊට පෙර නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ.පෙ. 502, කොළඹ 12 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"රජයේ අධිනීතිඥ තනතුර සඳහා අයදුම් කිරීම - 2025"** යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.12.28** දින වේ.

***සටහන :*** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අසම්පූර්ණ අයදුම්පත්‍ර ද දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :***

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන අංක 09 යටතේ සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 50ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතරින්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අංක 10 යටතේ සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :***

I මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් ය.

III **2020.10.16** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **18/2020 හා එහි සංශෝධනයන්** හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතු ය.

IV රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, නීතිපති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හි ඇතුළත් කොන්දේසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

**3. *වැටුප් පරිමාණය :-***

මෙම තනතුරට **AGS 2-2025, රු.131,300 - 10 x 2,940 - රු. 160,700/-** ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

**4. *අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් :***

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකමක් සේ සැළකේ.

**5. *පළපුරුද්ද :***

ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැළකේ.

**6. *වයස් සීමාව :***

අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනට වයස අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු **35** ට නොවැඩි වීම.

**7.** ***කායික සුදුසුකම් :***

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**8.** ***වෙනත් සුදුසුකම් :***

i. අයදුම්කරුවන් ශ්‍රී ලාංකාවේ පුරවැසියන් විය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවකු වී නොසිටිය යුතු ය.

iv. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් **2025.12.28** දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9.** **ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අධ්‍යාපන සුදුසුකම් :** | | 20 |
| | i. රජයේ පිළිගත් ආයතනයකින් /විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය(LLM) | 10 | |
| | ii. රජයේ පිළිගත් ආයතනයකින්/ විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 08 | |
| | iii. රජයේ පිළිගත් ආයතනයකින් /විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය(LLB) පළමුපෙළ සාමාර්ථය | 07 | |
| | iv. රජයේ පිළිගත් ආයතනයකින් /විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය | 06 | |
| | v. රජයේ පිළිගත් ආයතනයකින් /විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය | 05 | |
| | vi. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය | 07 | |
| | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය<br>රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් යනු, සංස්ථාපිත නීති අධ්‍යාපන සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් වේ.<br>(ඉහත සඳහන් සියලුම කුසලතාවයන් උපරිම ලකුණු 20කට සීමා වේ.)<br>*ඉහත අධ්‍යාපන සුදුසුකම් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේ දී සහතික මගින් සනාථ කළ යුතුය. | 06 | |
| | **වෘත්තීය පළපුරුද්ද :** | | 20 |
| | i. නඩු කටයුතු සඳහා අධිකරණය ඉදිරියේ පෙනී සිටීමෙන් දක්වන කුසලතා | 10 | |
| | ii. ලියාපදිංචි නීතිඥවරයකු ලෙස හෝ නීති උපදේශකවරයකු ලෙස සේවය කිරීමෙන් දක්වන ලද කුසලතා<br>(ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය.)<br>*සටහන* : විනිශ්චයකාරවරයකුගෙන් වෘත්තීය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ. | 10 | |

| අනු අංකය | ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03. | **විශේෂ දක්ෂතා** | | 20 |
| | i. සන්නිවේදන කුසලතාවය | 05 | |
| | ii. හිටිවන කථිකත්වයේ කුසලතාවය | 05 | |
| | iii. සභාවක් ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය | 05 | |
| | iv. භාෂාව හැසිරවීමේ හැකියාව | 05 | |
| 04. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා** | | 40 |
| | i. පෞරුෂත්වය | 10 | |
| | ii. නායකත්ව ගුණාංග | 10 | |
| | iii. නීතිය හා අධිකරණ කටයුතු පිළිබඳව ඇති දැනුම | 20 | |
| | **එකතුව** | | 100 |

**10.** **අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**
අවසන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංකය | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | තර්ක ශක්තිය | 25 |
| 02 | කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව | 25 |
| 03 | ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව | 25 |
| 04 | මූලික නෛතික සිද්ධාන්ත දැනුම | 25 |
| එකතුව | | 100 |

**11.** **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණවල දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

***සැළකිය යුතුය :***

අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.
ආ. සම්මුඛ පරීක්ෂණයේ දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සළකා බලනු නොලැබේ.

**12.** **සාවද්‍ය තොරතුරු සැපයීම :-**
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**13.** පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම හෝ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් පිරවීම හෝ මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණක් පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**14.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**පාරින්ද රණසිංහ (කණිෂ්ඨ),**
ජනාධිපති නීතිඥ,
නීතිපති.

2025 නොවැම්බර් මස 25 දින,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

11 - 377

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

අංක 1925/37 හා 2015.07.28 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 මාර්තු මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications- Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 දෙසැම්බර් මස 08 දින පෙ.ව. 9.00ට** විවෘත වන අතර **2026 ජනවාරි මස 02 දින ප.ව. 9.00ට අවසන් වේ.**

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන ඉහත සඳහන් සේවා ව්‍යවස්ථාවේ උපලේඛන III යටතේ පළකර ඇත. විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

02. *විභාග පටිපාටිය* - ලිඛිත පරීක්ෂණය :

| *විෂය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය (පැය)* |
|---|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | 100 | 1 1/2 |
| 02 | මුදල් රෙගුලාසි | 100 | 1 1/2 |
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | 100 | 02 |
| 04 | Communication Skills | 100 | 02 |

03. *විෂය නිර්දේශය* :

| *විෂය අංකය* | *විෂයය* | *විෂයය අන්තර්ගතය* |
|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | රජයේ ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VII, VIII, IX, XII, XIII, XIV, XXIV, XXVIII, XXX සහ XXXI යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I, III, IV, V, VI, VIII, X හා XII යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |
| 02 | මුදල් රෙගුලාසි | රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ I, II, V, VIII, XII හා XIV පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |

| විෂය අංකය | විෂයය | විෂයය අන්තර්ගතය |
|---|---|---|
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් ආඥා පනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ.<br><br>i. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මග)<br>ii. 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව<br>iii. 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව<br>iv. 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ<br>v. 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික, ද්විතීයික හා අ.පො.ස.(උ.පෙළ))<br>vi. 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත<br>vii. 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත<br>viii. 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත<br>ix. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත<br>x. 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරය පනත<br>xi. 13 සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>xii. අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති |
| 04 | Communication Skills | This is to assess the English language competence of the following subject areas.<br><br>- **English Grammar :-** Tense and Number, Sentences (Simple/ Compound / Complex / Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, Prepositions<br>- **Communication Competencies :-** General Greetings and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills, Interviewing Skills, Meeting<br>- **Writing Skills :-** Internal modes of communication, Formal correspondence skills, Writing Descriptions/ Explanations, Summary Writing skills, Report Writing skills |

***සැ.යු :-*** අපේක්ෂකයන් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40% ක ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

04. *විභාගයේ භාෂා මාධ්‍ය* :

4.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. විභාගය සඳහා ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යම මෙම විභාගයේ භාෂා මාධ්‍ය ලෙස තෝරා ගත යුතු ය.

4.3 අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්මේත්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. *ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා දඬුවම්* - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ විධිවිධාන අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව, ව්‍යාජ තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

08. අයදුම්පතේ මුද්‍රිත පිටපත **2025** දෙසැම්බර් මස **29** වන දින හෝ ඊට පෙර **“ විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ.”** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **“ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025”** යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

09. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එම නීති පිළිපැදීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන්

විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

11. විභාග සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් සහතික කර තිබිය යුතු ය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

12. *විභාග ගාස්තු:*

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතු ය.

i. පළමු වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.
ii. ඊට පසු එක් වතාවක් සඳහා පහත සඳහන් පරිදි විභාග ගාස්තු අයකරනු ලැබේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව | රු. 500/- කි. |
| එක් විෂයයකට ගාස්තුව | රු. 250/- කි. |

විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

13. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ලේකම්, අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතින බව පෙනී යන්නේ නම් සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2025 නොවැම්බර් මස 06 දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ**
**පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

**First Bar Examination for the Officers in Grade III of Sri Lanka Teacher Educators' Service-2025**

අයදුම්පත "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ." යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. (විභාගයේ නම කවරයේ වම් පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:- සිංහල ) 2 ☐
දෙමළ ) 3
ඉංග්‍රීසි ) 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .......................................................................
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ………………………………………………………………
(උදා. : GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................

02. (i) සේවය කරන විද්‍යාපීඨය / ගුරු විද්‍යාලය / ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට යොමු කරනු ලැබේ :
………………………………………………………………………………………

(ii) පෞද්ගලික ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
………………………………………………………………………………………

03. දුරකථන අංකය :

(i) ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

(ii) ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

04. (i) ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

(ii) ස්ත්‍රී/ පුරුෂ භාවය: පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1

05. (i) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) පදවි නාමය : .......................................................
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. නිවේදනයේ දෙවන ඡේදය යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂයය සහිතව අයදුම් කරන විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද? එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍ය සඳහන් කරන්න.

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* |
|---|---|---|---|
| | | | |
| | | | |

08. ( i ) ඔබ විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවෙක් ද? ( ඔව් / නැත )
( ii) ඔව් නම් විශේෂ අවශ්‍යතාවේ ස්වභාවය : ……………………………………………………..……………………………...
……………………………………………………………………………………………………………………………

09. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, *ගැසට්* නිවේදනයේ 04 ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :-........................................ ……………………………………………………………,
අයදුම්කරුගේ අත්සන.

10. අත්සන සහතික කිරීම

.................................. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ / ගුරු විදුහලේ / ගුරු මධ්‍යස්ථානයේ/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරියකු / නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් රාජකාරියේ නියුතු ..................................................... මයා / මිය / මෙනවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

......................................................
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව
(ආසන්නතම මාණ්ඩලික නිලධාරියා)

නම : ………………………………………..
පදවි නාමය : ………………………………………..
ලිපිනය : ………………………………………..
දිනය : ………………………………………..

11. විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට / අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත් ගැසට් නිවේදනයේ 04 ඡේදයට අනුව ඔහු / ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි. අපේක්ෂකයා/ අපේක්ෂිකාව විභාග ගාස්තුවෙන් නිදහස් බවත් / නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...........................................................
පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන
පදවි නාමය : …………………………………
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදාළ නොවන වචන කපා හරින්න.)

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරින් සඳහා වූ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ විදේශ භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2025

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරින් සඳහා වූ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග හා විදේශ භාෂාව පිළිබඳ පරීක්ෂණය **- 2025, 2026 පෙබරවාරි මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය:

පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වී ඇත.

පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම්වලට හා විදේශ භාෂාවලට අදාළ විෂය නිර්දේශ හා අනෙකුත් විධිවිධාන පරිශිෂ්ටය ‘අ’ හි ද දක්වා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී, ඔවුන්ගේ කැමැත්ත අනුව පෙනී සිටීමට නිලධාරින්ට අවසර තිබේ.

04. කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| *විෂය අංකය* | *විෂයය* | *කාලය පැය* |
|---|---|---|
| **I කොටස** | | |
| 01 | මුදල් | 03 |
| 02 | ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය | 03 |
| **II කොටස** | | |
| 03 | මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 04 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 05 | ජාත්‍යන්තර කටයුතු | 03 |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ කටයුතු අමාත්‍යාංශ රෙගුලාසි හා පරිගණක හැකියාව | 03 |

දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| *විෂය අංකය* | *විෂයය* | *කාලය පැය* |
|---|---|---|
| **I කොටස** | | |
| 21 | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය | 03 |
| 22 | පරිපාලනය<br>(අ) කාර්යාලය ක්‍රම හා සංවිධාන ක්‍රම<br>(ආ) ආයතන සංග්‍රහය<br>( 1 හා II වෙළුම) | 03 |
| **II කොටස** | | |
| 23 | මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 24 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 25 | ජාත්‍යන්තර කටයුතු | 03 |

**විදේශ භාෂා**

| | | |
|---|---|---|
| 07 | අරාබි | 02 |
| 08 | ප්‍රංශ | 02 |
| 09 | රුසියානු | 02 |
| 10 | ස්පාඤ්ඤ | 02 |
| 11 | හින්දි | 02 |
| 12 | චීන | 02 |
| 13 | ජර්මන් | 02 |
| 14 | ජපන් | 02 |
| 15 | ඉතාලි | 02 |
| 16 | කොරියානු | 02 |

05. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරින්ගේ අවධානය පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 ඡේදය කෙරෙහි යොමු කරවනු ලැබේ.

“දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළු) -

උසස් කිරීමේ විභාගවලට මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට ද මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවය. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ

නිලධාරියා සේවයට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.”

05.1 ප්‍රතිඵල නිකුත් කිරීම:

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය, පළමු කාර්යක්ෂමතා කඩඉම හා දෙවන කාර්යක්ෂමතා කඩඉම ලෙස වෙන් වෙන් වශයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පමණක් ලබා දෙනු ඇත.

06. විදේශ භාෂා හැර අනෙකුත් ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට හැකි වනු පිණිස විභාග කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරනු ඇත. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. අයදුම්පත, ආදර්ශ ආකෘතියට අනුව, A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම භාවිත කළ යුතු අතර, අයදුම්පතේ ශීර්ෂ අංක 1 සිට 8 දක්වා පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත්වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් යෙදිය යුතුය. විභාග දෙකටම පෙනී සිටින අයදුම්කරුවන් ඒ ඒ විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම් පතට ඇතුළත් කොට ලදුපත අලවා තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න.

09. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

10. විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සියලුම අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් **2025 දෙසැම්බර් 12 වැනි දින** හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට හැකිවන පරිදි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය වෙත එවිය යුතුය. විදේශ දූත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් දූත මණ්ඩල ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

12. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව

විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

12.1 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12.2 අයදුම්පතේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

13. ඉහත 12 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමු දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීම සඳහා අවසර දෙනු නොලැබේ.

14. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. පළමුවැනි වතාවට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ගාස්තුවලින් නිදහස්වන අතර, ඉන්පසුව පෙනී සිටින අවස්ථාවල දී පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

(අ) පළමුවැනි වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.
(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | *රු. ශත* |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1200.00 |
| එක් විෂයයකට | 600.00 |

විභාග ගාස්තු, විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට හෝ විදේශ දූත මණ්ඩලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවීමට කටයුතු කරන්න. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

16. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. විභාගය සම්බන්ධ අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලත්වයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**අරුණි රණරාජ,**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක
අමාත්‍යාංශයේ ලේකම්.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ-1.

**ආදර්ශ අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ විදේශ භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2025**

1st and 2nd Efficiency Bar Examination and Foreign Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2025

අයදුම්කරු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. ඉල්ලුම් කරන විභාගය :
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

| *විභාගය* | *අදාළ අංකය* |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| විදේශ භාෂාව | 3 |

02. (අ) (i) මුලකුරු සමග නම :
(සිංහලෙන්/දෙමළෙන්) : ..........

(ii) මුලකුරු සමග නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........

(ආ) (i) සම්පූර්ණ නම:
(සිංහලෙන්/දෙමළෙන්) : ..........

(ii) සම්පූර්ණ නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........

03. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. උපන් දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

06. ජංගම දුරකථන අංකය: | | | | | | | | | | |

07. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

08. ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය :

වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

09. වර්තමාන තනතුර : ......................................................................

10. නිවේදනයේ 04 ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම් කරන විභාගයට අදාළ විෂය අංක පැහැදිලිව සඳහන් කළ යුතු ය. (අයදුම්පතේ සඳහන් කර ඇති විෂයයන් හැර වෙනත් විෂයයන්වලට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.)

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| i. | |
| ii. | |
| iii. | |
| iv. | |
| v. | |
| vi. | |

11. අයදුම්කරු මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාග අංකය, විෂයයන්, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න:
...............................................................................................................

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක ........................... දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.
ගෙවන ලද විභාග ගාස්තුව රු. ........................................

.......................... ............................................
දිනය අපේක්ෂකයාගේ අත්සන

**විභාග ගාස්තු**

I ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය/විදේශ දූත මණ්ඩලය :..........................
II ගෙවූ මුදල :..........................
III ගෙවූ දිනය :..........................
IV ලදුපත් අංකය :..........................

**මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය.**
**(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)**

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ................................................ මයා/මිය/මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සනත්, අයදුම්කරු නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර: ...............

දිනය:...........................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**පරිශිෂ්ටය "අ"**

**01. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය :**

1.1 පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විතවන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

**1.2** පහත සඳහන් විෂයයන් යටතේ විභාගය පවත්වනු ලැබේ.

**I වැනි කොටස**

(i) **මුදල්** - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (x වැනි පරිච්ඡේදය හැර)

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුව උදා: ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්.

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

(ii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය

**II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍ර:**

(i) මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ ජාත්‍යන්තර නීතිය
(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය
(iii) ජාත්‍යන්තර කටයුතු
(iv) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ කටයුතු අමාත්‍යාංශ රෙගුලාසි සහ පරිගණක හැකියාව

1.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහාවන අතර, සාමර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

1.4 නිලධාරියකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත්වූවකු ලෙස සලකනු ලැබේ.

**02. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය :**

2.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

2.2 මතු සඳහන් විෂය යටතේ විභාගය පවත්වනු ලැබේ.

**I වැනි කොටස**

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය,

(ii) පරිපාලනය - පහත කරුණු ආවරණයවන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත

(අ) කාර්යාල ක්‍රම සහ සංවිධාන ක්‍රම
(ආ) ආයතන සංග්‍රහය I වෙළුම සහ II වෙළුම

**II වැනි කොටස**

(i) මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ ජාත්‍යන්තර නීතිය

(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය
(iii) ජාත්‍යන්තර කටයුතු

2.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

2.4 නිලධාරියකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත් වූවකු ලෙස සලකනු ලැබේ.

*සටහන:*

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න නියම කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විකාශය අළලාය.

(ii) ද්විපාර්ශ්වික මෙන්ම බහුපාර්ශ්වික දෙගණයේම අන්තර් රාජ්‍ය සම්බන්ධතා එකිනෙකට අදාළව රාජ්‍යතාන්ත්‍රික නීතිය සහ ගිවිසුම් නීතිය යන ක්ෂේත්‍රය අළලා ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රශ්න නියම කරනු ලැබේ.

**03.** විදේශ භාෂා:

3.1. විදේශ භාෂා

(i) අරාබි
(ii) ප්‍රංශ
(iii) රුසියානු
(iv) ස්පාඤ්ඤ
(v) හින්දි
(vi) චීන
(vii) ජර්මන්
(viii) ජපන්
(ix) ඉතාලි
(x) කොරියානු

3.2 ඉහත එක් එක් ලිඛිත ප්‍රශ්න පත්‍රය පැය දෙකක කාලසීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (ඉංජිනේරු - සිවිල්) , තාක්ෂණ සහායක (ඉංජිනේරු - යාන්ත්‍රික) සහ තාක්ෂණ සහායක (ඉංජිනේරු - විදුලි) තනතුරුවල III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාග - 2025**

**Department of Agriculture
Open Competitive Examination for Recruitment to the post of Technological Assistant (Engineering – Civil / Mechanical / Electrical) Grade III - 2025**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (ඉංජිනේරු- සිවිල්) , තාක්ෂණ සහායක (ඉංජිනේරු - යාන්ත්‍රික) සහ තාක්ෂණ සහායක (ඉංජිනේරු - විදුලි) තනතුරුවල III ශ්‍රේණියේ 2024.10.30 දිනට පවතින පහත සඳහන් පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සඳහා, පැවැත්වෙන විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *විවෘත පදනම මත පුරවන පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| තාක්ෂණ සහායක (ඉංජිනේරු සිවිල්) | 05 |
| තාක්ෂණ සහායක (ඉංජිනේරු යාන්ත්‍රික) | 04 |
| තාක්ෂණ සහායක (ඉංජිනේරු විදුලි ) | 01 |

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **<u>2025.12.26</u>** දින වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩුවිය යුතු අතර 35 ට නොවැඩි විය යුතුය.

03. විභාගයට ඉදිරිපත්වන අපේක්ෂක/ අපේක්ෂිකාවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වනවිට පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යවේ.

| *තනතුර* | *7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම්* |
|---|---|
| තාක්ෂණ සහායක (ඉංජිනේරු - සිවිල් / ඉංජිනේරු - යාන්ත්‍රික / ඉංජිනේරු - විදුලි) | තනතුරේ කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) හෝ ඉන් ඉහළ මට්ටමට ඇතුළත්වන්නා වූ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම |

03.2 වෙනත් සුදුසුකම් :-

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට සහතික විය යුතු ය.

- ❖ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- ❖ විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතු ය.
- ❖ යම් ආගමක නිකායක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
- ❖ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.

***සැලකිය යුතුයි*** - අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන විට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

05. වැටුප් :-

වැටුප් කේත අංකය - MT- 01(2025)
වැටුප් පරිමාණය - රු 50090 - 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 – රු. 84420/=

06. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් වියයුතුය. තවද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා ඔබ විසින් දායක මුදල් ගෙවිය යුතු ය.

II. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

III. දැනට බලාත්මක බඳවා ගැනීම් පරිපාටියේ කොන්දේසි හා ඉදිරියේදී කරනු ලැබිය හැකි බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

07. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත . ඒ අනුව අයදුම්පත A 4 (21cm x 30cm ) පරිමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙළ කළ යුතුවේ. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද 04 සිට 07 තෙක් දෙවන පිටුවට ද 08 සිට 11 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය 04 වන පිටුවට ද වන ලෙස සකස් කළ යුතුය.ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ . ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025/12/26 දින හෝ එදිනට ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පරණ ගලහ පාර, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක ඉංජිනේරු සිවිල් / ඉංජිනේරු යාන්ත්‍රික /ඉංජිනේරු විදුලි තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2025 ” යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඉ) මෙම තනතුරු සඳහා විභාග ගාස්තුව රු. 1000.00ක් වන අතර එම ගාස්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් මහජන බැංකුව පේරාදෙණිය ශාඛාවේ ඇති අංක 057-100179027204 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් ගෙවා, අයදුම්කරු නමින් ලබා ගන්නා ලද ලදුපත, අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ එක් පසකින් පමණක් ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ .එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතුවට ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

**8 විභාග පරිපාටිය**

(අ) නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින මාධ්‍යය හා ඉල්ලුම් කරන තනතුර ද අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත .අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු ,රජයේ හෝ රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා අත්සන සහතික කරවාගත යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනීසිටීමට අවසර දෙනු නොලැබේ .අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ආ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය වෙත දන්වා සිටිය යුතුයි .ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපතක් ද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපතක් ද අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමඟ ඉල්ලුම් කරන ලද විභාගයේ නම ,ඔබගේ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කොට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර ,ඉහත විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කර විමසා සිටීම ද වඩාත් ඵලදායීවනු ඇත.

(ඇ) විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය .ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය .එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනු ඇත .තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

(ඉ) විෂය නිර්දේශය -

1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1 යි ,මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකුල හැකියාව ,ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් ,තීරණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිළියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

2. තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය (කාලය පැය 1 යි, මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ විෂයානුබද්ධ දැනුම පිළිබඳ ව්‍යුහගත ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රය

| *තනතුර* | *විෂයය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| තාක්ෂණ සහයක (ඉංජිනේරු සිවිල් / ඉංජිනේරු යාන්ත්‍රික / ඉංජිනේරු විදුලි ) | බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු තර්කනය ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීම් හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස්කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

| *තනතුර* | *විෂයය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| තාක්ෂණ සහයක (ඉංජිනේරු සිවිල්) | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය ) | ගෘහ නිර්මාණ ශිල්පය ඇඳීම්, ව්‍යුහමය ඇඳීම් , ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ විස්තර, ගොඩනැගිලි පරිමාණ මිනුම් පිළියෙළ කිරීම හා ඇස්තමේන්තු කිරීම, මැනීම සහ මට්ටම් ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, ව්‍යුහ, සේවාවන්, ආරක්ෂිත ක්‍රම, ඉගැන්වීමේ ක්‍රම |
| තාක්ෂණ සහයක (ඉංජිනේරු යාන්ත්‍රික) | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය ) | පෑස්සුම්, කම්මල් වැඩ, වඩුවැඩ , වැඩපළ යන්ත්‍ර , තහඩු වැඩ, කැපුම් තල, ද්‍රව්‍ය ගුණ හා සරල ගණනය කිරීම්, මෝටර් යාන්ත්‍රික විද්‍යාව, යන්ත්‍රාගාර, යාන්ත්‍රික ඇඳීම හා ජ්‍යාමිතික ඇඳීම, ආරක්ෂිත ක්‍රම, ඉගැන්වීමේ ක්‍රම |
| තාක්ෂණ සහයක (ඉංජිනේරු විදුලි) | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය ) | 01. විදුලි බල උත්පාදනයේ මූලික සිද්ධාන්ත පිළිබඳ දැනුම<br>02. විදුලි මෝටර්, විදුලි ජනක යන්ත්‍ර වර්ග හා ඒවායේ ප්‍රායෝගික භාවිතය, දෝෂ හඳුනාගැනීම හා අලුත්වැඩියාව<br>03. තෙකලා හා එකලා විදුලි පරිපථවල භාවිතා කරන උපාංග පිළිබඳ දැනුම හා වයර් වර්ග හඳුනා ගැනීම<br>04. ගොඩනැගිලි හා යන්ත්‍රාගාරවල විදුලි රැහැන් සැකසීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම DRAWINGS පිළියෙළ කිරීම<br>05. දුරකථන පද්ධති හා රැහැන් ඇදීම පිළිබඳ මූලික දැනුම<br>06. සාමාන්‍ය කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා වූ ඉලෙක්ට්‍රොනික් පරිපථ පිළිබඳ දැනුම<br>07. පරිගණක හා උපාංග පරිගණක ජාලගත කිරීම , OS හා මෘදුකාංග ස්ථාපිත කිරීම පිළිබඳ දැනුම.<br>08. වාහනවල කෘෂි යන්ත්‍රවල විදුලි පද්ධති පිළිබඳ මූලික දැනුම<br>09. වායු සමකරණ හා ශීතකරණ පිළිබඳ මූලික දැනුම<br>10. මල්ටි මීටරය හා අනෙකුත් මිනුම් උපකරණ භාවිතය පිළිබඳ දැනුම<br>11. ආරක්ෂිත ක්‍රම - වැඩපළක තිබිය යුතු ආරක්ෂිත ක්‍රම<br>12. ඉගැන්වීමේ ක්‍රම - ඉහත ක්ෂේත්‍රයන් පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික පන්ති පැවැත්වීමේ දී අනුගමනය කෙරෙන ඉගැන්වීම් ක්‍රම පිළිබඳ අවබෝධය |

(ඊ) මාධ්‍යය -

විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලිනි. අපේක්ෂකයින් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(උ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(ඌ) විභාගය පවත්වන ස්ථානය හා දිනය

මෙම විභාගය **2026 පෙබරවාරි** මාසයේ දී මහනුවර දී කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

**08.** **බඳවා ගැනීමේ ක්‍රමය**

I. ඉහත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ.

II. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම විභාගයේ ලකුණු කුසලතා අනුපිළිවෙළ පදනම් කර ගෙන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති ඉහළම ලකුණු ලබා ගත් අය පමණක් පුරප්පාඩු සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනමනු නොලැබේ.)

III. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

IV. කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

i. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය

ii. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

V. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

VI. නිවේදනයේ සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත්ව විභාගය සමත් වුව ද සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා නොබලන අතර කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ / ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. ව්‍යාජ තොරතුරු හා කූට ලේඛන ඉදිරිපත් කර යම් අයකු පත්වීමක් ලබාගත්තේ වුව ද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට / ඇයට විරුද්ධ නිත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

09. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය **ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමආරච්චි,**
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 11 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

***තාක්ෂණ සහායක (ඉංජිනේරු - සිවිල්) , තාක්ෂණ සහයක (ඉංජිනේරු- යාන්ත්‍රික) සහ තාක්ෂණ සහායක (ඉංජිනේරු - විදුලි) තනතුරුවල III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාග - 2025***

***Department of Agriculture***
***Open Competitive Examination for Recruitment to the post of Technological Assistant (Engineering – Civil / Mechanical / Electrical) Grade III - 2025***

01. විභාගයට පෙනී සිටින මාධ්‍යය - සිංහල - 1
දෙමළ - 2

( අදාළ අංකය කොටුව තුළ ලියන්න )

02. ඉල්ලුම් කරනු ලබන තනතුර :-

1. තාක්ෂණ සහායක (ඉංජිනේරු සිවිල්)
2. තාක්ෂණ සහායක (ඉංජිනේරු යාන්ත්‍රික)
3. තාක්ෂණ සහායක (ඉංජිනේරු විදුලි)

03. නම :

1.1 මුලකුරු සමඟ නම :- ..................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) (උදා: PERERA A.B.)

1.2 සම්පූර්ණ නම :-
..................................................................................................................................
..................................................................................................................................
(සිංහලෙන් /දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.4 දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ස්ථිර ලිපිනය :-

1.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :-..................................................................................................................................
..................................................................................................................................

1.2 සිංහලෙන්/දෙමළෙන්. :-..........................................................................................................

1.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :- ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

1.4 පදිංචි දිස්ත්‍රික්කය :- ...........................................................................................................

1.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..............................................................................................

05. ස්ත්‍රී පුරුෂ භාවය :-

ස්ත්‍රී - 1 ☐ ( අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 2

06. 6.1 උපන් දිනය :-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

6.3 විවාහක අවිවාහක බව :- ☐

විවාහක - 1
අවිවාහක - 2 ( අදාළ අංකය කොටුව තුළ ලියන්න )

07. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් :-

| *ඩිප්ලෝමාව/ NVQ සහතිකය* | *ඩිප්ලෝමාව / NVQ සහතිකය නිකුත් කළ ආයතනයේ නම* | *සමත් වූ වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* | *ඩිප්ලෝමාව/ NVQ සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |

08. ඔබ අධිකරණයක් ඉදිරියේ වරදකරුවකු වී තිබේ ද?......................................................
වරදකරුවකු වී තිබේ නම් විස්තර සඳහන් කරන්න
...........................................................................................................................................
.............................................................................................................

**09.** **විභාග ගාස්තු ගෙවන ලද ස්ථානය :-**

09.1 ගාස්තු ගෙවන ලද දිනය : ..................................

09.2 ලදුපත් අංකය : ..................................

09.3 මුදල : ..................................

| |
|---|
| **විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.**<br>**(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)** |

**10.** **අයදුම්කරුගේ සහතිකය :**

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බවට මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සෙකුවීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බවද ප්‍රකාශ කරමි.

**11.** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..............................................................................................................යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .................................................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

...................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ......................................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-

තනතුර :-

ලිපිනය :-

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**12.** **දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා (අනවශ්‍ය වචන කපා හරින්න.)**

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරු /අයදුම්කාරිය මෙම විභාගය සඳහා පෙනී සිටීමට *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/ නැති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි /නොහැකි බව සහතික කරමි.

.........................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

(නිල මුද්‍රාව)

දිනය : ...............................

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) හා තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) තනතුරුවල III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

## Department of Agriculture

### Open Competitive Examination For the Recruitment to Grade III of Technological Assistant (Agriculture Extension) and Technological Assistant (Agriculture Research) of the Department of Agriculture

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) හා තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) තනතුරුවල III ශ්‍රේණියේ 2024.10.30 දිනට පවතින පහත පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගයට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) | 101 |
| තාක්ෂණ සහායක (කෘෂි පර්යේෂණ) | 12 |

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.12.26** දින වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 35 ට නොවැඩි විය යුතු ය.

03. විභාගයට ඉදිරිපත් වන අපේක්ෂක අපේක්ෂිකාවන් අයදුම්පත භාරගන්නා අවසන් දින වනවිට පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| *තනතුර* | *7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම්* |
|---|---|
| තාක්ෂණ සහයක ( කෘෂි ව්‍යාප්ති / කෘෂි පර්යේෂණ) | තනතුරේ කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) හෝ ඉන් ඉහළ මට්ටමකට ඇතුළත් වන්නා වූ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම |

03.2 වෙනත් සුදුසුකම් :-

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට සහතික විය යුතු ය.

- ❖ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- ❖ විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතු ය.
- ❖ යම් ආගමක, නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
- ❖ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත ද විය යුතු ය.

***සැලකිය යුතුයි -*** අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

05. වැටුප් :-

වැටුප් කේත අංකය - MT- 01 (2025)
වැටුප් පරිමාණය - රු 50090 - 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 – රු. 84420/=

06. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය. තවද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා ඔබ විසින් දායක මුදල් ගෙවිය යුතු ය.

II. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

III. දැනට බලාත්මක බඳවා ගැනීම් පරිපාටියේ කොන්දේසි හා ඉදිරියේ දී කරනු ලැබිය හැකි බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

07. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. ඒ අනුව අයදුම්පත A 4 (21cm x 30cm) පරිමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතුවේ. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද 04 සිට 07 තෙක් දෙවන පිටුවට ද 8 සිට 11 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය 04 පිටුවට ද වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ

සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.12.26** දින හෝ එදිනට ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් , පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පරණ ගලහ පාර, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක කෘෂි ව්‍යාප්ති /කෘෂි පර්යේෂණ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය. තනතුරු දෙකම සඳහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර එම තනතුරු දෙක සඳහාම අයදුම්කරන්නේ නම් අයදුම්පතේ අංක 02 හි ඔබගේ කැමැත්ත පරිදි අනුපිළිවෙළ සඳහන් කළ යුතු ය.

(ඉ) මෙම තනතුරු දෙක සඳහා විභාග ගාස්තුව රු1000.00. ක් වන අතර එම ගාස්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් මහජන බැංකුව පේරාදෙණිය ශාඛාවේ ඇති අංක 057-100179027204 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් ගෙවා, අයදුම්කරු නමින් ලබා ගන්නා ලද ලදුපත, අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ එක් පසකින් පමණක් ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතුවට ප්‍රයෝජනවත්වනු ඇත.

(ඊ) අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපැලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08 **විභාග පරිපාටිය**

(අ) නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින මාධ්‍යය හා ඉල්ලුම් කරන තනතුර ද අයදුම්කරුගේ සහතික කරන ලද අත්සන ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත .අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා අත්සන සහතික කරවාගත යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

